# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2024 අංක 18 දරන
# ලේඛන ලියාපදිංචි කිරීමේ
# (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2024 අප්‍රේල් මස 01 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2024 අප්‍රේල් මස 05 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 12.00 | **තැපැල් ගාස්තුව :** රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2024 අංක 18 දරන
ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2024 අප්‍රේල් මස 01 වන දින]

එල්.ඩී.-ඕ. 69/2017

**(117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** (1) මේ පනත 2024 අංක 18 දරන ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

(2) මේ වගන්තියේ විධිවිධාන හැර මේ පනතේ විධිවිධාන, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මේ පනතේ "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධාන පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත්වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

**2.** (මේ පනතේ "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 8 වන වගන්තියේ (ආ) ඡේදයේ අතුරු විධානයේ (xi) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේදය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:- 117 වන අධිකාරයේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම

"(xii) 2024 අංක 17 දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනතේ විධිවිධානවලට යටත් වන්නා වූ ගනුදෙනුවක් සම්බන්ධයෙන් වන යම් ගිවිසුමක්.".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන පරිච්ඡේදය (16 වන වගන්තියේ සිට 24 වන වගන්තිය දක්වා ඒ වගන්ති දෙක ද ඇතුළත්ව) මෙයින් ඉවත් කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන පරිච්ඡේදය ඉවත් කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ V වන පරිච්ඡේදයේ ශීර්ෂය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන ශීර්ෂය ආදේශ කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ V වන පරිච්ඡේදයේ ශීර්ෂය ප්‍රතියෝජනය කිරීම

"V වන පරිච්ඡේදය

**ඉඩම්වලට බලපාන සාධන පත්‍රවලට අදාළ විධිවිධාන"**

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තියේ "ඉඩමකට හෝ ඔඩපනයකට, උකසකට හෝ විකුණුම් බිල් පත්‍රයකට බලපාන සාධන පත්‍රයක්" යන වචන වෙනුවට "ඉඩමකට බලපාන සාධන පත්‍රයක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "ඉඩමකට හෝ චංචල දේපළකට බලපාන" යන වචන වෙනුවට"ඉඩමකට බලපාන" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ පැති සටහන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන්:-

"දිස්ත්‍රික්ක කිහිපයක
පිහිටි ඉඩම්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය සංශෝධනය කිරීම

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තියේ "තමා විසින් ලියාපදිංචි කරන ලද ඉඩම්වලට සහ ඔඩපනවලට, උකස්කරවලට හෝ විකුණුම් බිල්පත්‍රවලට බලපාන සාධන පත්‍ර පිළිබඳව" යන වචන වෙනුවට "තමා විසින් ලියාපදිංචි කරන ලද ඉඩම්වලට බලපාන සාධන පත්‍ර පිළිබඳව" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ III වන කොටසෙහි 2 වන අයිතමයෙහි "III වන, IV වන, V වන, VI වන පරිච්ඡේද යටතේ පවත්වාගෙන යනු ලබන යම් පොතක් හෝ සුචියක්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "III වන, V වන හෝ

VI වන පරිච්ඡේදය යටතේ පවත්වාගෙන යනු ලබන යම් පොතක් හෝ සුචියක්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන පරිච්ඡේදය යටතේ ලියාපදිංචි කරන ලද සාධන පත්‍රවල බලාත්මකභාවය

**9.** (1) නියමිත දිනයේ දී ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන පරිච්ඡේදය යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇති-

(අ) චංචල දේපළ පිළිබඳ ඔඩපනයක්, උකසක් හෝ විකුණුම් බිල් පත්‍රයක්; හෝ

(ආ) (i) යම් නිශ්චල දේපළක සවිකිරීමක් හා සම්බන්ධ යම් බැඳියාවක්; හෝ

(ii) යම් නිශ්චල දේපළක උකසක්, සෘණභාරයක් හෝ බද්දක් යටතේ වන ගෙවීමකට ඇති අයිතිය පවරා දීමේ දී ඒ පවරාදීම මගින් එම නිශ්චල දේපළ කෙරෙහි වන පැවරුම්කරුගේ බැඳියාව භාරදීම හෝ පැවරීම සිදු නොවන අවස්ථාවක, එවැනි පවරාදීමක්,

ඇති කරන යම් සාධන පත්‍රයක් බලාත්මකව පවතින අවස්ථාවක දී, නියමිත දිනයේ සිට අවුරුදු දෙකක කාලසීමාවක් සඳහා ඒ චංචල දේපළ පිළිබඳ ඔඩපනය, උකස හෝ විකුණුම් බිල් පත්‍රය හෝ ඒ නිශ්චල දේපළෙහි සවිකිරීම හා සම්බන්ධ බැඳියාව හෝ ඒ නිශ්චල දේපළෙහි උකස, සෘණභාරය හෝ බද්ද යටතේ වන ගෙවීමකට ඇති අයිතිය පවරාදීම තවදුරටත් බලාත්මක විය යුතු නමුත්, ඒ අවුරුදු දෙකක කාලසීමාව ඉකුත් වීමට පෙරාතුව ඒ චංචල දේපළ පිළිබඳ ඔඩපනය, උකස හෝ විකුණුම් බිල් පත්‍රය හෝ ඒ නිශ්චල දේපළෙහි සවිකිරීම හා සම්බන්ධ බැඳියාව හෝ ඒ නිශ්චල දේපළෙහි උකස, සෘණභාරය හෝ බද්ද යටතේ වන ගෙවීමකට ඇති අයිතිය පවරාදීම 2024 අංක 17 දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනතේ අදාළ විධිවිධාන යටතේ ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් සාධන පත්‍රයක් 2024 අංක 17 දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ විට ඒ සාධන පත්‍රය මුලින් ම නීත්‍යනුකූලව බලාත්මක කළ හැකි සාධන පත්‍රයක් බවට පත් වූයේ යම් දිනයක ද, ඒ දිනයේ සිට පරිපූර්ණත්වයට පත් වූ ලෙසට සලකනු ලැබිය යුතු අතර, ඒ සාධන පත්‍රය මුලින් ම නීත්‍යනුකූලව බලාත්මක කළ හැකි සාධන පත්‍රයක් බවට පත් වූ අවස්ථාවේ දී හිමිකම් ලැබුවේ යම් ප්‍රමුඛතාවකට ද ඒ ප්‍රමුඛතාව තවදුරටත් බලපැවැත්විය යුතු ය.

(3) නියමිත දිනයේ සිට අවුරුදු දෙකක් ඉකුත් වීමට පෙරාතුව 2024 අංක 17 දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත යටතේ ලියාපදිංචි කරනු නොලබන (1) වන උපවගන්තියේ සඳහන් සාධන පත්‍රයක් එම කාලසීමාව ඉකුත් වීමෙන් පසුව නීත්‍යනුකූලව බලාත්මක කළ නොහැකි විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**10.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.